# ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

## ශාස්ත්‍රවේදී (බාහිර) උපාධිය සඳහා ලියාපදිංචි කිරීම - 2026

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රවේදී (බාහිර) උපාධි පාඨමාලාව සඳහා 2026 අධ්‍යයන වර්ෂයට ලියාපදිංචි වීමට සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් 2025.12.29 දින දක්වා අයදුම්පත් භාර ගනු ලැබේ.

### අයදුම්පත පිරවීමට ප්‍රථම මෙම විස්තර පත්‍රිකාව කියවන්න

01 .i. පහත සඳහන් අඩුපාඩු සහිත අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන බැවින් තම අයදුම්පත සම්පූර්ණ කර එය තැපැල් කිරීමට පෙර නිසි ලෙස සම්පූර්ණ කර තිබේ ද යන්නත්, අධ්‍යාපන සහතිකවල සහතික කරන ලද ඡායා පිටපත් අමුණා ඇත් ද යන්නත් පරීක්ෂා කර බැලීම අයදුම්කරුගේ වගකීම වේ.

1. අයදුම්පතේ දිනය හා අත්සන නොමැති වීම
2. අයදුම්පත හා අදාළ සහතික පත්‍ර සහතික කර නොමැති වීම
3. ඡායා පිටපත් කර හෝ තමා විසින් ම සකස් කර ගන්නා ලද අයදුම්පත් භාවිත කිරීම
4. තෝරා ගන්නා ලද විෂයයන් සඳහන් නොකිරීම,

ii. අයදුම්පතේ විමසා තිබෙන සියලු ම තොරතුරු ඉදිරිපත් කළ යුතුය. ඉදිරිපත් කිරීමට කිසිවක් නොවේ නම් "අදාළ නොවේ" යනුවෙන් හෝ "නැත" යනුවෙන් හෝ සඳහන් කළ යුතු ය.

02. අයදුම්පත නිසි ලෙස සම්පූර්ණ කර 2025.12.29 හෝ එදිනට පෙර හෝ ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට **ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතු ය.** අයදුම්පත බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ "බාහිර උපාධි" 2025/2026" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතු ය.

**අයදුම්පත් එවිය යුතු ලිපිනය :**

සහකාර ලේඛකාධිකාරී,
පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය හා බාහිර විභාග මධ්‍යස්ථානය,
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය,
214, බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

03. ඔබ මෙම පාඨමාලාව සඳහා ලියාපදිංචි කර ගනු ලබන්නේ ඔබගේ **අධ්‍යාපන සහතික පත්‍ර පරීක්ෂා කිරීමෙන් පසුව** බැවින්, අයදුම්පත හා සහතික කරන ලද සහතික පත් එවීම අනිවාර්ය බව සලකන්න.

04. අසම්පූර්ණ හා අවසන් දිනයට (2025.12.29) පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05. **අධ්‍යයන පීඨය**

උපාධි පාඨමාලාව සඳහා අපේක්ෂකයකු ලියාපදිංචි කරගනු ලබන විෂයය අනුව ඔහු/ඇය අයත් පීඨය තීරණය වේ. ඒ අනුව තෝරාගත් විෂයයන්ගෙන් තුනෙන් දෙකක් අයත් පීඨය ඔහු/ඇය අයත් පීඨය ලෙස සැලකේ.

ඉල්ලුම් කරන ලද විෂයය පත්‍රයක් වෙනස් කිරීමට අවශ්‍යය වන්නේ නම් අදාළ පීඨයට අයත් විෂයය පත්‍රයක් තෝරා ගත යුතු ය. විෂයය පත්‍ර වෙනස් කිරීමට අවස්ථාව ලැබෙනුයේ පාඨමාලාව ආරම්භ කර මාසයක් ඇතුළත පමණි.

06. වර්ෂාවසාන පරීක්ෂණය සිංහල හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍ය දෙකින් ම පැවැත්වෙන අතර, අයදුම්කරුවකු විසින් තෝරා ගත යුත්තේ ඉන් එක් භාෂා මාධ්‍යයක් පමණි. ලියාපදිංචි වීමෙන් පසුව භාෂා මාධ්‍ය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

07. **නිර්දිෂ්ට අධ්‍යයන විෂයයන්**

ශාස්ත්‍රවේදී (බාහිර) උපාධි පාඨමාලාව සඳහා මෙම විශ්වවිද්‍යාලයේ අනුමත විෂයයන් පහත පරිදි ය.

**ප්‍රධාන විෂයයන්**

බෞද්ධ අධ්‍යයන පීඨය:

1. බෞද්ධ දර්ශනය
2. බෞද්ධ සංස්කෘතිය
3. පුරාවිද්‍යාව
4. සමය අධ්‍යයනය හා තුලනාත්මක දර්ශනය
5. බෞද්ධ සමාජ වැඩ
6. බෞද්ධ මනෝවිද්‍යාව හා උපදේශනය

භාෂා අධ්‍යයන පීඨය:

7. පාලි
8. සංස්කෘත
9. සිංහල
10. ඉංග්‍රීසි
11. දෙමළ

**අනිවාර්ය විෂයය පත්‍ර**

12. පාලි අනිවාර්ය විෂයය පත්‍ර 01
13. පාලි අනිවාර්ය විෂයය පත්‍ර 02
14. ඉංග්‍රීසි භාෂා ප්‍රවේශය (English Proficiency)
15. තොරතුරු තාක්ෂණය (Information Technology)

**(අංක 12 සහ 15 යන විෂය පත්‍ර හතර සියලු අපේක්ෂකයන් සඳහා අනිවාර්ය වේ.)**

08. **තෝරාගත යුතු විෂයයන්**

- ශ්‍රී ලංකාවේ ඉතිහාසය (තෝරාගත් තේමා 11වන සියවස දක්වා)
- බෞද්ධ මනෝවිද්‍යා උපදේශනය
- සිංහල ව්‍යාකරණ ප්‍රවේශය
- දෙමළ භාෂා ප්‍රවේශය
- හින්දි භාෂාව
- ජපන් භාෂාව
- ප්‍රංශ භාෂාව
- කොරියන් භාෂාව
- චීන භාෂාව

**සියලු ම අපේක්ෂකයන් මෙම අතිරේක විෂයයන් අතරින් එක් විෂයයක් තෝරාගැනීම අනිවාර්ය වේ.**

සැ.යු. ඃ

සිංහල, දෙමළ, බෞද්ධ මනෝවිද්‍යාව හා උපදේශනය යන ප්‍රධාන විෂයයන් හදාරන සිසුන්ට තෝරාගත යුතු විෂයය ඒකකයට අයත් සිංහල ව්‍යාකරණ ප්‍රවේශය, දෙමළ භාෂා ප්‍රවේශය සහ බෞද්ධ උපදේශනය යන විෂයය පත්‍ර හැදෑරිය නොහැකිය.

09. **ආයතනික පුහුණුව / පර්යේෂණ ව්‍යාපෘතිය**

වයස අවුරුදු පනහට අඩු විද්‍යාර්ථීන් තෙවන වසර තුළ දී ආයතනික පුහුණුව (පැය 300) සම්පූර්ණ කළ යුතුය.

වයස අවුරුදු පනහට වැඩි විද්‍යාර්ථීන් තෙවන වසර තුළ දී ආයතනික පුහුණුව හෝ පර්යේෂණ ව්‍යාපෘතිය (වචන 10000) සම්පූර්ණ කළ යුතුය

10. **විෂයයන් තෝරා ගැනීම හා අධ්‍යයන සම්භාර ආවරණය කිරීම**

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව කොටස් තුනකින් යුක්ත ය.

1. ශාස්ත්‍රවේදී උපාධි I පරීක්ෂණය
2. ශාස්ත්‍රවේදී උපාධි II පරීක්ෂණය
3. ශාස්ත්‍රවේදී උපාධි III පරීක්ෂණය

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රවේදී (බාහිර) උපාධි පාඨමාලාව හදාරන සිසුන් සියලු දෙනා **බෞද්ධ දර්ශනය හෝ බෞද්ධ සංස්කෘතිය යන විෂයයන් දෙකෙන් එකක් අනිවාර්යයෙන් තෝරා ගත යුතු අතර, එම විෂයයන් දෙක ම එක් ශිෂ්‍යයෙකුට හැදෑරීමට නොහැක.**

**සැ.යු. :**

★ දෙමළ භාෂාව විෂයයක් වශයෙන් හැදෑරීම සඳහා (මූලික සුදුසුකම්වලට අමතර ව) පහත අවශ්‍යතා එකක්වත් සම්පූර්ණ කළ යුතු ය.

- අ.පො.ස. (උසස් පෙළ) විභාගයෙන් දෙමළ භාෂාව සමත් ව තිබීම
- ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයෙන් හෝ වෙනත් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උසස් අධ්‍යාපන ආයතනයකින් හෝ දෙමළ භාෂාව පිළිබඳ උසස් ඩිප්ලෝමා පරීක්ෂණයකින් සමත් වීම
- පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උසස් අධ්‍යාපන ආයතනයකින් හෝ දෙමළ භාෂා ඩිප්ලෝමා පරීක්ෂණයකින් සමත් ව පාසල් හෝ පිරිවෙන් ක්ෂේත්‍රයේ දෙමළ භාෂා ගුරුවරයකු වශයෙන් සේවය කිරීම හා අවම වශයෙන් වසර දෙකක සේවා පළපුරුද්දක් තිබීම

★ ශාස්ත්‍රවේදී (බාහිර) උපාධි පාඨමාලාව සඳහා ඉංග්‍රීසි ප්‍රධාන විෂයයක් ලෙස තෝරා ගත හැක්කේ ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි උසස් ඩිප්ලෝමාව හෝ ලංකාවේ වෙනත් රාජ්‍ය විශ්වවිද්‍යාලයකින් පිරිනමන ඉංග්‍රීසි උසස් ඩිප්ලෝමාවකින් සමත් වූ සිසුන්ට හා උසස් පෙළ සඳහා ඉංග්‍රීසි ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති සිසුන්ට පමණි.

ශාස්ත්‍රවේදී (බාහිර) උපාධි පාඨමාලාව අධ්‍යයන සම්භාර 90කින් සමන්විත වේ. එක් උපාධි පරීක්ෂණයක් සඳහා අවම වශයෙන් අධ්‍යයන සම්භාර 30ක් වන පරිදි අපේක්ෂකයා තම විෂයය ඒකක තෝරා ගත යුතු ය. ප්‍රධාන විෂයයන් තුන සඳහා විෂයය පත්‍ර දහඅටක් (18) වන අතර, වසර තුන අවසානයේ ඉන් අධ්‍යයන සම්භාර 72ක් හිමි වේ. අනිවාර්ය පාලි පත්‍ර දෙක සඳහා අධ්‍යයන සම්භාර 06 ක් හිමි වේ. අනිවාර්ය ඉංග්‍රීසි විෂයය සඳහා අධ්‍යයන සම්භාර 03 ක් ද පරිගණක විෂය සඳහා අධ්‍යයන සම්භාර 03 ක් ද වශයෙන් එම විෂයය පත්‍ර දෙක සඳහා අධ්‍යයන සම්භාර 06 ක් හිමි වේ. තවත් අතිරේක විෂයයක් ද තෝරාගත යුතු ය. ඊට අධ්‍යයන සම්භාර 03ක් හිමි වේ. ආයතනික

පුහුණුව හෝ පර්යේෂණ ව්‍යාපෘතිය අනිවාර්යය ය. ඒ සඳහා ද අධ්‍යයන සම්භාර 03ක් හිමි වේ.

| විෂයය | විෂයය පත්‍ර | අධ්‍යයන සම්භාර |
|---|---|---|
| ප්‍රධාන විෂයය 03 | 18 (වර්ෂ තුනට) (18×4) | 72 |
| අනිවාර්ය ඉංග්‍රීසි | 01 | 03 |
| අනිවාර්ය පරිගණක | 01 | 03 |
| අනිවාර්ය පාලි | 02 | 06 |
| අතිරේක විෂය | 01 | 03 |
| ආයතනික පුහුණුව හෝ පර්යේෂණ ව්‍යාපෘතිය | | 03 |
| | | 90 |

ශාස්ත්‍රවේදී උපාධි I පරීක්ෂණය සඳහා තෝරාගත් විෂයයන් ශාස්ත්‍රවේදී උපාධි II පරීක්ෂණය සහ ශාස්ත්‍රවේදී උපාධි III පරීක්ෂණය සඳහා ද තෝරාගත යුතු වේ. තෝරාගත් විෂයයන් හා අතිරේක විෂයයන් අදාළ කාල සීමාවෙන් පසු වෙනස් කිරීමට හෝ මාධ්‍යය වෙනස් කිරීමට අවස්ථාව නොලැබෙන බව කරුණාවෙන් සලකන්න.

අනිවාර්ය විෂය පත්‍ර සියල්ල පැවැත්වෙනුයේ ශාස්ත්‍රවේදී උපාධි I පරීක්ෂණයේ දී ය. යම් අපේක්ෂකයකුට පළමු අවස්ථාවේ දී එම විෂයය ඒකක සමත් විය නොහැකි වුවහොත් අපේක්ෂකයාගේ අභිමතය පරිදි අධ්‍යයන වර්ෂ පහක් ඇතුළත පෙනී සිට සම්පූර්ණ කළ හැකි ය. එම කාලසීමාව තුළ උක්ත පත්‍ර සමත් වීමට නොහැකි සිසුන්ගේ ලියාපදිංචිය අවලංගු වේ.

## 11. වර්ෂාවසාන පරීක්ෂණ

වර්ෂාවසාන පරීක්ෂණ විශ්වවිද්‍යාලය මගින් සෑම වසරක ම පැවැත්වීමට කටයුතු කරන අතර, ලියාපදිංචි වී සිටින විෂයයන්ට පමණක් අදාළ පරීක්ෂණයේ දී පෙනී සිටීමට අවසර ඇත. විභාග ලියාපදිංචි කිරීම, ප්‍රවේශ පත්‍ර හා කාලසටහන් තැපැල් මගින් යවනු ලැබේ.

## 12. ගාස්තු

**ශාස්ත්‍රවේදී උපාධි I පරීක්ෂණය සඳහා ගෙවිය යුතු මුදල**

| | | |
|---|---|---|
| විස්තර හා අයදුම්පත් ගාස්තු | - | රු. 1000.00 |
| ශිෂ්‍ය වාර්තා පොත සඳහා | - | රු. 500.00 |
| විෂය නිර්දේශය | - | රු. 1000.00 |
| ලියාපදිංචි ගාස්තු | - | රු. 1500.00 |
| ශිෂ්‍ය හැඳුනුම්පත් නිකුත් කිරීම | - | රු. 500.00 |
| දේශන ගාස්තු | - | රු. 19000.00 |
| සම්මන්ත්‍රණ ගාස්තු | - | රු. 1500.00 |
| විභාග ගාස්තු | - | රු. 9000.00 |
| **ගෙවිය යුතු මුළු ගාස්තු** | - | **රු. 34000.00** |

**ශාස්ත්‍රවේදී උපාධි II පරීක්ෂණය සඳහා ගෙවිය යුතු මුදල**

| | | |
|---|---|---|
| ලියාපදිංචි ගාස්තු | - රු. | 1000.00 |
| දේශන ගාස්තු | - රු. | 14000.00 |
| සම්මන්ත්‍රණ ගාස්තු | - රු. | 1500.00 |
| විභාග ගාස්තු | - රු. | 7500.00 |
| **ගෙවිය යුතු මුළු ගාස්තු** | **- රු.** | **24000.00** |

**ශාස්ත්‍රවේදී උපාධි III පරීක්ෂණය සඳහා ගෙවිය යුතු මුදල**

| | | |
|---|---|---|
| ලියාපදිංචි ගාස්තු | - රු. | 1000.00 |
| දේශන ගාස්තු | - රු. | 15000.00 |
| සම්මන්ත්‍රණ ගාස්තු | - රු. | 3000.00 |
| විභාග ගාස්තු | - රු. | 7500.00 |
| **ගෙවිය යුතු මුළු ගාස්තු** | **- රු.** | **24000.00** |

**අමතර ගාස්තු**

| | | |
|---|---|---|
| ශිෂ්‍ය වාර්තා පොතේ පිටපතක් සඳහා | රු. | 1000.00 |
| ලියාපදිංචිය දීර්ඝ කිරීම සඳහා (එක් අධ්‍යයන වර්ෂයකට) | රු. | 2000.00 |
| ශිෂ්‍ය හැඳුනුම්පතේ පිටපතක් සඳහා | රු. | 500.00 |
| අසමත් එක් විෂයය පත්‍රයක් සඳහා සම්මන්ත්‍රණ ගාස්තු | රු. | 1000.00 |
| විශ්වවිද්‍යාලය වෙත දී ඇති තොරතුරු නැවත වෙනස් කිරීම සඳහා | රු. | 1000.00 |
| ශාස්ත්‍රවේදී උපාධි I පරීක්ෂණය අසමත් විෂයය පත්‍රයක් සඳහා වි.වි.ගාස්තු | රු. | 1000.00 |
| ශාස්ත්‍රවේදී උපාධි II පරීක්ෂණය අසමත් විෂයය පත්‍රයක් සඳහා වි.වි. ගාස්තු | රු. | 1200.00 |
| ශාස්ත්‍රවේදී උපාධි III පරීක්ෂණය අසමත් විෂයය පත්‍රයක් සඳහා වි.වි.ගාස්තු | රු. | 1400.00 |

**සටහන්:** මෙම ගාස්තු විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් කලින් කලට සංශෝධනය කිරීමට යටත් වේ.

වැඩි විස්තර 0112580609 සහ 0112502944 යන දුරකථන අංක මගින් පශ්චාද් උපාධි හා බාහිර විභාග මධ්‍යස්ථානයෙන් විමසා ලබාගත හැකි ය.

සහකාර ලේඛකාධිකාරී,
පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය හා බාහිර විභාග මධ්‍යස්ථානය,
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය,
214, බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.